**උහන ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 06 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 22 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| i. | සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.98,000 ක් වටිනා සෙවිලි උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේ දී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| ii. | පරිත්‍යාග වශයෙන් ලද රු.99,999 ක් වටිනා රූපවාහිනී යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේ දී ප්‍රාග්ධන වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| iii. | පළාත් සභාවෙන් ලැබිය යුතු කාර්යාල වැටුප් හා සභික දීමනා රු.2,260,229 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | මේ පිළිබඳව සොයා බලා ඉදිරි ගිණුම් සැකසීමේ දී නිවැරදි කරමි. |
| iv. | පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සිදුකළ තිස්සපුර බටහිර මාර්ගය සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා ගෙවිය යුතු රු.68,490 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී ලැබිය යුතු ප්‍රතිපාදනයක් ලෙස ගිණුම් ගත කරමි. |

| | | | |
|---|---|---|---|
| v. | රු.200,000 ක් වටිනා වාහන 03 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලු වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | 2017 තක්සේරුවට අනුව දක්වා ඇති රු.200,000 ක් වටිනා වාහන ප්‍රාග්ධන කිරීමට කටයුතු කරමි. |
| vi. | වාහන හා යන්ත්‍රෝපකරණ 09 ක් තක්සේරු කර ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ප්‍රාග්ධනිත කළ යුතු වේ. | නැවත තක්සේරුවක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| vii. | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.50,000 ක පුස්තකාල පොත් රු.500,000 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි වටිනාකම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| viii. | 2018 වර්ෂයට අදාලව ලැබිය යුතු රු.898,200 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| ix. | සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාලව ලැබිය යුතු හිඟ මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(i) ලැබිය යුතු ගිණුම්** | | |
| බදු දී තිබුණු කඩකාමර 12 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට අයකර ගත යුතු රු.137,222 ක හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019.12.31 දිනට පැවති මෙම හිඟයෙන් රු.37,674 ක් මේ වන විට අයකර ගෙන ඇත. |
| **(ii) ගෙවිය යුතු ගිණුම්** | | |
| පෙර වර්ෂවලට අදාලව නිරවුල් නොකල විවිධ තැන්පත් රු.2,648,755 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | තැන්පත් ගිණුමේ එන මෙම අගය පෙර සිට පැවත එන අගයකි. මේ පිළිබඳ සොයා බලා ඉදිරි ගිණුම් සැකසීමේ දී නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.16,003,333 ක වත්කම් විෂයන් 06 ක් හා රු.2,883,155 ක වගකීම් විෂයන් 03 ක් සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේ දී ලේඛන සකස් කර යාවත්කාලීන කර විගණනයවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | 44,204 | සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන් 2019 වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදලට අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | චක්‍රලේඛ අනුව කටයුතු කර නොමැති අතර ඉදිරියේ දී සොයා බලා කටයුතු සිදු කරමි. |
| (ආ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන් ගේ භාර අරමුදල් පනත | 14,818 | සේවකයින් 06 දෙනෙකු වෙනුවෙන් 2019 වර්ෂයේ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | චක්‍රලේඛ අනුව කටයුතු කර නොමැති අතර ඉදිරියේ දී සොයා බලා කටයුතු සිදු කරමි. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය | - | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පනවා අදාල වියදම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා වියදම පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ අතුරු ව්‍යවස්ථා සැකසීමට කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 217 | - | ප්‍රාදේශීය සභාව විසින් භුක්ති විඳින ඉඩම් පවරාගෙන තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති මාලාව අනුව කටයුතු කළ යුතු වේ. | මේ වන විට ඉඩම් පවරා ගැනීම සඳහා අදාල කටයුතු සිදු කර ඇත. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>------------------ | | | | |
| | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | - | නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට නව ඇඟිලි සළකුණු යන්ත්‍රයක් ආයතනයේ සවි කර ඇත. |
| (ඊ) | 2015 ඔක්තෝබර් 10 දිනැති අංක 30/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය | - | ප්‍රාදේශීය සභාව විසින් භාවිතයට නොගන්නා වාහන හඳුනාගෙන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මගින් විකිණීම සඳහා යෝජනා කර තිබූ වාහන පොදු 47 පෝරමය මගින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) වෙත දන්වා ඇත. 2019 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල තීරණය අනුව නැවත අදාල කටයුතු සිදු කිරීමට ක්‍රියා කරන්නෙමු. |
| (උ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 46 දරන චක්‍රලේඛය | - | බදු දී තිබුණු උභන කඩකාමර 24 හි කුලිය වර්ෂ 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇති නමුත් මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,004,957 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,335,440 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| වරිපනම් හා බදු | 2,294,785 | 1,549,294 | 1,829,867 | 3,596,171 | 1,944,785 | 1,641,072 | 1,185,513 | 3,876,744 |
| කුලී | 8,624,568 | 5,642,732 | 5,727,443 | 137,222 | 5,830,736 | 5,283,934 | 5,376,956 | 221,933 |
| බලපත්‍ර ගාස්තු | 951,000 | 573,950 | 573,950 | - | 830,000 | 744,165 | 744,165 | - |
| වෙනත් ආදායම් | 5,802,000 | 5,520,212 | 5,678,324 | 2,168,039 | 4,340,000 | 4,457,749 | 5,311,435 | 2,326,151 |
| | **17,672,353** | **13,286,188** | **13,809,584** | **5,901,432** | **12,945,521** | **12,126,920** | **12,618,069** | **6,424,828** |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් බදු ලේඛනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් රු.2,961,668 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකරගත යුතු වේ. | පසුගිය වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාලව රු.1,398,286 ක් මේ වන විට අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.525,550 ක් හා මුද්දර ගාස්තු රු.1,642,489 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතු වේ. | මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සකසා අවශ්‍ය අනුමැතියට ඉදිරිපත් කර ඇත. නමුත් මේ වන තෙක් අනුමැතිය ලැබී නොමැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීම සඳහා රු.1,314,000 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුවකුට 2016 පෙබරවාරි 18 වන දින ගෙවා තිබුණි. ඉඩමේ අයිතිය නිරවුල් නොවීම නිසා මෙම ව්‍යාපෘතිය දිගින් දිගටම ප්‍රමාද වී තිබුණි. ආපසු මුදල් අයකර ගැනීම සඳහා සිදුකළ සාකච්ඡාවේදී කොන්ත්‍රාත්කරු වියදම් කර ඇති මුදල් අඩුකර ඉතිරි මුදල් 2019 පෙබරවාරි 25 දිනට පෙර ලබාදීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් ආපසු ලැබී නොතිබුණි. | කොන්ත්‍රාත්ක රුගෙන් අයකරගත යුතු ඉතිරි මුදල් ලබා ගැනීම හා සුදුසු ස්ථානයක් තෝරා ගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වේ. | උක්ත ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේදී උහන ප්‍රාදේශීය ලේකම් විසින් පිඹුරු අංක 350/16 දරන ඉඩම් කොටස නීත්‍යානුකූලව උහන ප්‍රාදේශීය සභාව වෙත පවරා දුන් අතර, ඊට පරිසර නිර්දේශයක් හා අනෙකුත් පාර්ශවයන්ගේ නිර්දේශ ලබා ගන්නා ලදී.<br>මෙම ඉඩම සම්බන්ධයෙන් යාබඳ ඉඩම් හිමිකරුවෙකු විරෝධවීමත් එවක ඛණිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය විසින් එම ඉඩමට යාබදව නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් හදුනාගෙන ඇති බැවින්, අදාල ඉඩමෙහි කසළ බැහැර කිරීම හා කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම නවතා දැම්මට සිදු විය. එසේම මේ සඳහා නියෝජ්‍ය අමාත්‍යතුමිය විසින් යෝජනා කරන ලද විකල්ප ඉඩම අම්පාර දිස්ත්‍රික්කයෙන් බැහැරව මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති බැවින් එම ඉඩමද මෙම ව්‍යාපෘතිය සඳහා නොගැලපුණි. එම නිසා කසල බැහැර කිරීමේ කටයුතු අම්පාර නගර සභාව වෙත ගෙනයාමට සිදු විය. මේ වන විට කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා නව ඉඩමක් ලබා ගැනීම කෙරෙහි උහන ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත නැවතත් යොමු කර ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක පුරප්පාඩු 15 ක් හා එක් තනතුරක අතිරික්තයක් පැවතුනි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවාගත යුතු වේ. | පුරප්පාඩු පවතින තනතුරු සඳහා පුරප්පාඩු සපුරා ගැනීමට ඉහළ ආයතන කළමනාකාරීත්වය වෙත දන්වා ඇත. |
| (ආ) ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් හා සේවකයින් 12 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.80,854 ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය නොවී පවතින සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල නිලධාරීන් ලිඛිතව දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) ස්ථිර පදනමින් 2014 වර්ෂයේ දී බඳවාගෙන තිබුණු සෞඛ්‍ය කම්කරුවෙකු හා මාර්ග කම්කරුවෙකු වෙනත් රාජකාරිවල යොදවාගෙන තිබුණු අතර, 2018 දෙසැම්බර් මස නැවතත් ආදේශක පදනමින් සෞඛ්‍ය කම්කරුවෙකු බඳවාගෙන, කාර්යාලයේ රාජකාරි සඳහා යොදවාගෙන තිබුණි. | බඳවාගනු ලබන කම්කරුවන් තනතුරට අදාල රාජකාරියේ යෙදවිය යුතු වේ. | පුස්තකාලාධිපති තනතුරු පුරප්පාඩු පවතින පුස්තකාල 03 හි රාජකාරි ආවරණය කරන පුස්තකාල සේවකයින්ට නිවාඩු ලබාදීමේ දී පවතින ගැටලුව විසඳීම සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුල පුස්තකාල කම්කරු තනතුරු නොමැති බැවින් මාර්ග කම්කරුවෙකු යොදා ගැනීමට සිදු විය.<br>එසේම කාර්යාලය තුළ කාර්යාල කාර්ය සහයක තනතුරෙහි රාජකාරි කළ අය වෙනත් රාජකාරීන් සඳහා අනුයුක්ත කිරීමට සිදු වූ බැවින් කාර්යාලය තුළ කාර්යාල කාර්ය සහයක තනතුරෙහි කටයුතු සඳහා සෞඛ්‍ය කම්කරුවෙකු යොදා ගැනීමට සිදු විය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත්, 2007 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයේදී ද වරිපනම් බදු අයකර තිබුණි. | නව වරිපනම් තක්සේරුවක් සිදුකර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලින් 2001 සිට 2013 දක්වා කාල පරිච්ඡේදය තුළදී සභාවට ලැබුණු වාහන හා යන්ත්‍රෝපකරණ 09 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන වල නිත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අප ආයතනයට රාජ්‍ය නොවන සංවිධාන මඟින් (UN, UNOPS) ලබා දුන් වාහන පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට එම් 06 පෝරමයේ පැවරුම්කරුගේ අත්සන ලබා ගැනීමට එම ආයතන වල කාර්යාල මෙරට තුළ නොපවතී. උතුරු නැගෙනහිර පුණුරුත්තාපන අමාත්‍යාංශය මගින් දී තිබුණද එම අමාත්‍යාංශය දැනට පළාත් සභාවේ නොමැති බැවින් එම වාහන පවරා ගැනීම සිදු කළ නොහැකි වී ඇත. නමුත් මෝටර් ග්‍රේඩරය, ටොන් 01 රෝල, ටොන් 12 රෝල හා ටොන් 08 රෝල අපහට ලබා දීමේදී ලියාපදිංචි කිරීම සිදු කර තිබුණේ නැත. එම වාහන ඉඩම් වාහන මෙන්ම මාර්ගයේ ධාවනය නොකර වෙනත් වාහනයක ප්‍රවාහනය කරන බැවින් ලියාපදිංචි කිරීමට අවශ්‍ය නොවන බව දන්වා ඇත. PE 8373 දරන කැබ්රථය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |

### 3.5.2 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන 08 ක් ආදායම් බලපත්‍ර නොගෙන ධාවනයේ යොදවා තිබුණි. | වාහන වල ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | ආදායම් බලපත්‍ර ලබා ගත හැකි වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු සිදු කිරීමට මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 3.6 ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | අනුමත අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරනු ලැබේ. |